# නිර්මාතෘවරයා සියලු ජීවිත බේරා ගැනීමට බලාපොරොත්තු වන්නේ ඇයි

නිර්මාතෘවරයා සියලු ජීවිත බේරා ගැනීමට බලාපොරොත්තු වන්නේ ඇයි? එයට හේතුව ඔවුන් සඳහා ඔහුගේ ආදරය, සහ ඒ ඔවුන්ව ජීවය සමඟින් ප්‍රදානය කරන ලද්දේ ඔහු නිසාවෙනි.

සක්වලෙහි නිර්මාණය, ස්ථායීතාව, පරිහානිය, සහ විනාශය චක්‍රයෙහි මෙම අවසන් අවධිය අතරතුර, තුන් රාජ්‍යන් නිර්මාණය කරමින් ඒ වාගේම ජීවීන් බේරාගත හැකි බොහෝ මාර්ග සහ ඉඩ ප්‍රාස්තාවන් සැලසුම් කරමින් සහ සුදුසු තැන තබමින්, සියල්ල අතරතුර මනුෂ්‍ය වර්ගයාගේ සංස්කෘතිය, චින්තනය, සහ චර්යාව සඳහා පදනමක් යොදමින් වර්ෂ මිලියන 200ක් නිර්මාතෘවරයා ගත කර තිබෙනවා. තවදුරටත් ඔහු ජීවී සංහතියෙහි පාපකාරී කර්මය පහත හෙලීමට සහ බේරුම් කිරීමට ඔහුගේම දිව්‍යමය ශරීරය යොදාගත්තා! ඔහු සියලුම ජීවිත බේරා ගැනීම සඳහා ඔහුගේ සියල්ල දී තිබෙනවා.

එම වර්ෂ මිලියන 200ක කාල සීමාව තුළ, නිර්මාතෘවරයා එකම වෙලාවෙහි බහුවිධ ශරීර සමඟ ගිණිය නොහැකි සංඛ්‍යාවක්, පුනරුප්පත්තිය ලැබුවා, සහ මානව වර්ගයාගේ සදාචාරයන් පාලනය කරන සහ ආරක්ෂා කරන අතරතුර මෙම ලෝකය තුළ මනුෂ්‍ය වර්ගයාගේ සංස්කෘතිය සඳහා පදනම යෙදුවා; මෙය මෙලෙස සිදු කළේ, දිනයක— අවසාන කාලය අතරතුර, ගැලවීමෙහි කාලපරිච්ඡේදය පැමිණෙන, කල්හි— මිනිසුන්ට ඔවුන් සඳහා දිව්‍යමය ජීවීන් විසින් නියම කරන ලද සම්මත තත්ත්වය ළඟා කරගැනීමටයි. මිනිසුන්ගේ ආත්ම දීර්ඝ සහ ඇදී යාම-ඉක්මවූ ඉතිහාස කාලපරිච්ඡේද තුළ නැවත නැවත පුණරුත්පත්තිය ලබා තිබෙනවා, සහ අවුරුදු දස මිලියන ගනන් බලා සිටිමින් ගතකර තිබෙනවා. කාලයත් සමඟ, ලෝකයේ මිනිසුන් බොහොමයකගේ ආත්මයන්ගේ සැබෑ ශරීර (සහ මෙය සියලුම ජනවර්ග සහ ජාතීන් සඳහා සත්‍ය වේ) නිර්මාතෘවරයා සමඟ යම් පවුල් සම්බන්ධයක ආකාරයක් පිහිටුවන ලදී. මෙය නිර්මාතෘවරයාට ලෝකයේ මිනිසුන්ට, ඔහුගේ මිනිසුන්ට, හුදෙක් වැඩියෙන් ආදරය කිරීමට හේතු විය. අවසාන කාලයෙහි පැමිණීමත් සමඟම, එවැනි සම්බන්ධයක් නොමැති ජීවීන් සඳහා මනුෂ්‍යයෙකු බවට පත්වීමට තහනම් වුණා; මෙය මෙලෙස සිදු වුණේ ගැලවීමෙහි කර්තව්‍ය වඩා හොඳින් ඉටු කරගැනීමට හැකිවනු පරිදියි. එම කාලය වනවිට, මෙම පෘථිවිය මත මිනිසුන්ගේ සැබෑ ශරීර සියල්ල එම ඔහුගේ මිනිසුන්ගේය. සහ මනුෂ්‍යයින් ලෙස ශරීර ඇති කරගෙන සහ ආධ්‍යාත්මික ඉගැන්වීම් බෙදා දීම ඉෂ්ට කළ, එම මින්සුන් විශ්වාස කරන දිව්‍යමය ජීවීනුත් ඒවාගේම වෙනවා. ඔවුන්ගේ දූත මෙහෙය වූයේ, මනුෂ්‍ය ස්වරූපය ආරෝපණය කරගන්නා අතරතුර, මිනිසාගේ ගැලවීම සඳහා දිව්‍යමයන් මඟින්, අවසානයේ දී, නිර්මාතෘවරයා විසින්, බලාපොරොත්තු වූ සංස්කෘතික පදනම යෙදීමයි. නිර්මාතෘවරයා මඟින් අන්තිමයේදී සිදුවන ගැලවීම බලාපොරොත්තුවෙන් ඔවුන් මෙම ලෝකයට උරුමකර දුන් ධර්මිෂ්ඨ සහ සත්‍ය ආගම් නොනවත්වා කරගෙන ගියේ මිනිසුන් ලෙස ඔවුන්ගේ සදාචාරය රැක ගැනීම පිණිසයි. නිර්මාතෘවරයාට ඔහුගේ මිනිසුන්ට ආදරය කිරීමට අයිතියක් තිබෙනවා, සහ ආදරයට ඔබිනවා යැයි ඔහු සිතන අය සඳහා ඔහුගේ ආදරය තවත් අධිකයි. ඔහු එසේ කිරීම

සඳහා හිමිකම් ඇතිව සිටිනවා, සහ කිසිම කෙනෙකු හෝ කිසිම වස්තුවකට ඒ සඳහා මැදිහත් වීමට අයිතියක් නැහැ! මෙම ජීවීන් උදෙසා ඒ ඔහුගේ උත්තරීතර කරුණාවයි!

සක්වල තුළ සියලුම දිව්‍යමය ජීවීන්ගේ අධිපති වන්නේ නිර්මාතෘවරයායි. අධිපතීන්ගේ අධිපති, රජුන්ගේ රජු මැවුම් කරු ඔහුයි, සහ සියලුම ජීවීන්ගේ පරම බලධාරියා ඔහුයි—තුන් රාජ්‍යයන්හි මිනිස් ජීවීන්ද ඇතුළත්ව, ආධ්‍යාත්මික ජීවීන්, සහ ද්‍රව්‍යමය දේවල්, සියල්ලම නිර්මාණය කළේ ඔහුය. ඔහුගේ ආදරය තමයි සියලුම ජීවීන් සඳහා අග්‍රගණ්‍යම සහ ඉතාමත්ම පූජනීයම ආශිර්වාදය! මේ ලෝකය තුළ කිසිම පුද්ගලයෙකු සඳහා ඔහු විසින් ආදරය ලැබීමට වඩා විශාලතර ගෞරවයක් තවත් නොමැත!

ලි හොන්ග්ෂි ගුරුතුමා

2023 අප්‍රේල් 17